# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2456/73 - 2025 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2025.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ නම් කල සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ලැබූ මාලක වීරසිංහ ආරච්චිගේ, ගයාන් ඕවිටිගල සහ වී. ජීවනන්දරාජා යන මහත්වරුන් වෙනුවට විකුම් ප්‍රදීප, ප්‍රසන්න වික්‍රමනායක සහ ගන්දික වැලිගමගේ යන මහත්වරුන්ද සේව්‍ය නියෝජිත සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබ සිටි බී. බුළුමුල්ල සහ ප්‍රදීප් හේමන්ත බණ්ඩාර ලියනගෙදර යන මහත්වරුන් වෙනුවට බිනේෂ් නියොමාල් පනන්වල සහ ඩී. බී. එස්. එල්. පෙරේරා යන මහත්වරුන්ද සේවක නියෝජිත සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබ සිටි කිට්නන් සෙල්වරාජ් මහතා වෙනුවට රෙංගසාමි සුරේෂ් කුමාර් මහතා ද පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යතුමා විසින් පත්කළ බව එකී ආඥාපනතේ 30 වැනි නියෝගය යටතේ නිවේදනය කරනු ලැබේ. මෙම පත්කිරීම 2026.12.31 දක්වා වූ කාලය සඳහා පමණි.

**එස්. එම්. පියතිස්ස,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 02 වැනි දින,
"මෙහෙවර පියෙස"
කොළඹ 05.

EOG 10 - 0052/1


1A - G 45508 — 09 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ නම් කල සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ලැබූ ජෝසප් දේවමාග්‍රට්, මාලක වීරසිංහ ආරච්චිගේ සහ කපිල ප්‍රියන්ත සෙනෙවිරත්න යන මහත්ම, මහත්මියන් වෙනුවට ඒ. ඒ. ඒ. එස්. රාජරත්න, එම්. ඒ. බී. වී. යූ. කුමාර බණ්ඩාරනායක හා ජී. ඒ. පියල් පත්මනාත යන මහත්වරුන්ද, සේවා නියෝජිත සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබ සිටි බී. බුළුමුල්ල සහ ප්‍රදීප් හේමන්ත බණ්ඩාර ලියනගෙදර යන මහත්වරුන් වෙනුවට නිස්සංක බණ්ඩාර සෙනෙවිරත්න සහ ඩී. බී. එස්. එල්. පෙරේරා යන මහත්වරුන්ද පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යතුමා විසින් පත්කළ බව එකී ආඥාපනතේ 30 වැනි නියෝගය යටතේ නිවේදනය කරනු ලැබේ. මෙම පත්කිරීම 2026.12.31 දක්වා වූ කාලය සඳහා පමණි.

**එස්. එම්. පියතිස්ස,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 02 වැනි දින,
"මෙහෙවර පියෙස"
කොළඹ 05.

EOG 10 - 0052/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.